# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1718/27 - 2011 අගෝස්තු 12 වැනි සිකුරාදා - 2011.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නගර සභා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 14 වැනි වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම 1978 අගෝස්තු මස 10 වැනි දිනැති අංක 329/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් සංස්ථාපනය කරන ලද හම්බන්තොට නගර සභාව, හම්බන්තොට මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2011 නොවැම්බර් මස පළමුවැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08-685/1

---

**මහා නගර සභා ආඥාපනත**

නියමය

මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය), 2, 3, 5 සහ 9 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, මෙම නියමයෙන්-

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.


1A - G 14918— 830 (2011/08)

(2) එම උපලේඛණයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා එම මහා නගරයේ සීමා ලෙස නිශ්චය කරමි ;

(3) මෙම නියමයයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි ;

**"හම්බන්තොට මහා නගර සභාව"**

(4) හම්බන්තොට මහා නගර සභාව නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයකු සහ වෙනත් සභිකයින් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු යැයි නියම කරමි.

(5) හම්බන්තොට මහා නගර සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2011 නොවැම්බර් මස පළමුවැනි දිනය වශයෙන් නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

***උපලේඛනය***

***I වැනි කොටස***

පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාශවලින් සමන්විත භූමි ප්‍රදේශය-

(89) කොහොලන්කල, (90) සිරිබෝපුර, (91) කැලියපුර, (92) සාමෝදාගම, (93) හම්බන්තොට නැගෙනහිර, (94) හම්බන්තොට බටහිර සහ (123) මිරිජ්ජවිල

***II වැනි කොටස***

හම්බන්තොට මහා නගර සභාවේ පරිපාලන සීමා :

*උතුරට :*

මිරිජ්ජවිල සිට සූරියවැව දක්වා වූ අඩි 100 මාර්ගයේ මධ්‍ය රේඛාව, අංක 120 දරන බැල්ලගස්වැව සහ අංක 92 දරන සාමෝදාගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම සමඟ ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී, ඉහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ ඊසාන දිශාවට අංක 90 දරන සිරිබෝපුර ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ඊසාන දිශාවට අංක 120 දරන බැල්ලගස්වැව සහ අංක 90 දරන සිරිබෝපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ අංක 91 දරන කැලියපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට වයඹ දිශාවට අංක 120 දරන බැල්ලගස්වැව සහ අංක 91 දරන කැලියපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ අංක 95 දරන ගොන්නෝරුව ග්‍රාම නිලධාරී කොට්ඨාශ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ඊසාන දිශාවට අංක 95 දරන ගොන්නෝරුව සහ අංක 91 දරන කැලියපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ මලල ආරේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

*නැගෙනහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කර ඇති ලක්ෂ්‍යයෙන් ආරම්භ වී මලල ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ පහළට මලල ආරේ මධ්‍ය රේඛාව මලල කලපුවේ මායිම හා සම්බන්ධ වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට මලල කලපුවේ බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට මලල මෝදර බටහිර මායිම වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

*දකුණට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට වඩදිය රේඛාව ඔස්සේ බටහිර දිශාවට මිරිජ්ජවිල හන්දියේ සිට මුහුද දක්වා වූ අඩිපාරේ මධ්‍ය රේඛාව සහ වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

*බටහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට මිරිජ්ජවිල හන්දිය දක්වා වූ අඩිපාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරට කොළඹ-වැල්ලවාය (ඒ 2) ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව සහ සූරියවැව-මිරිජ්ජවිල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට සූරියවැව මිරිජ්ජවිල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ප්‍රථමයෙන් සඳහන් කර ඇති ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

08-685/2

---

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

*නියමය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ හම්බන්තොට ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළව, 1987 මැයි මස 12 දිනැති අංක 453/13 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලදුව, 2005 දෙසැම්බර් මස 01 දිනැති අංක 1421/26 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙන් සංශෝධනය කරන ලද නියමය, එකී පනතේ 9අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, මෙම නියමයෙන් -

(1) එහි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට මෙහි උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි ;

(2) මෙම නියමය ක්‍රියාත්මක විය යුතු දිනය 2011 නොවැම්බර් මස පළමුවන දිනය වශයෙන් නියම කරමි.

ඒ. එල් එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය,

2011 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

***උපලේඛනය***

***I වන කොටස***

පහත සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාශවලින් සමන්විත භූමි ප්‍රදේශය :

(81) බුන්දල, (82) සිරියාගම, (83) පල්ලෙමලල, (84) ජුල්ගමුව, (85) බඳගිරිය, (86) තම්මැන්නාව, (87) යහන්ගල බස්නාහිර, (88) යහන්ගල නැගෙනහිර, (95) ගොන්නෝරුව, (96) කැටැන්වැව, (97) එලල්ල, (116) සියඹලාගස්විල උතුර, (117) සියඹලාගස්විල දකුණ, (118) ගල්වැව, (119) උඩබෙරගම, (120) බැල්ලගස්වැව, (121) පහල බෙරගම, (122) අරවනමුල්ල, (124) සිසිලසගම, (125) වලව, (126) ගොඩවාය, (127) දෙහිගහලන්ද සහ (128) මානපජාව.

***II වන කොටස***

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :

*උතුරට :*

ලුණුගම්වෙහෙර හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පොදු මායිම, හම්බන්තොට ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී, නැගෙනහිර දෙසට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 47 දරන මහඅළුත්ගම්ආර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම, අංක 49 දරන පහළ මත්තල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම, අංක 48 දරන මත්තල ග්‍රාම නිලධාරි කොට්ට්ඨාශයේ දකුණු මායිම, අංක 63 දරන මිහිඳුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම, අංක 65 දරන සේනපුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම, අංක 79 දරන රඹුක්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම සහ අංක 78 දරන වැලිගත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු සහ නැගෙනහිර මායිම ඔස්සේ ලුණුගම්වෙහෙර හා තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පොදු මායිම හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 28 දරන තිස්සපුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම, අංක 24 දරන විජේපුර ග්‍රාම නිලධාරි

කොට්ඨාශයේ දකුණු මායිම සහ අංක 23 දරන කෝන්වැලැන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ කිරිඳිඔය හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

නැගෙනහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයෙන් ආරම්භ වී කිරිඳිඔය බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට ඉන්දියන් සාගරයේ වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

දකුණට :

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට වඩදිය රේඛාව ඔස්සේ බටහිර දෙසට මලල මෝදර බටහිර මායිම වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට මලල කලපුවේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශාවට මලල ආරේ මධ්‍ය රේඛාව කලපුවට සම්බන්ධ වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට මලල ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට අංක 95 දරන ගොන්නෝරුව සහ අංක 91 දරන කැලියපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම මලල ආරේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ඉහත කී ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ නිරිත දෙසට අංක 120 දරන බැල්ලගස්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මායිම හමුවල ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ගිණිකොණ දිශාවට අංක 120 දරන බැල්ලගස්වැව සහ අංක 91 දරන කැලියපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ අංක 90 දරන සිරිබෝපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට නිරිත දිශාවට අංක 120 දරන බැල්ලගස්වැව සහ අංක 90 දරන සිරිබෝපුර යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ අංක 92 දරන සාමෝදාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට නිරිත දෙසට අංක 120 බැල්ලගස්වැව සහ අංක 92 සාමෝදාගම ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ මිරිජ්ජවිල සිට සූරියවැව දක්වා වූ අඩි 100 මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට දකුණු දිශාවට අඩි 100 මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කොළඹ - වැල්ලවාය (A2) මාර්ගයේ මධ්‍ය රේඛාව අඩි 100 මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට දකුණු දිශාවට මුහුද දක්වා වූ අඩිපාරේ මධ්‍ය රේඛාව ඔස්සේ වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට බටහිර දිශාවට වඩදිය රේඛාව ඔස්සේ හම්බන්තොට සහ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

බටහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයෙන් ආරම්භ වී උතුරු දෙසට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 142 දරන වාඳුරුප්ප ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම, අංක 143 දරන අම්බලන්තොට දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම, අංක 144 දරන අම්බලන්තොට උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිමද, අංක 140 දරන බෝලාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම, අංක 141 දරන කුඩා බෝලාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු හා නැගෙනහිර මායිම, අංක 140 දරන බෝලාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම, අංක 135 දරන මෝදරපිලිවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම සහ අංක 134 දරන කොග්ගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම අංක 138 දරන ගොඩකොග්ගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිරට මායිම ඔස්සේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 137 දරන හබරත්තවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම, අංක 136 දරන වැදිවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු හා නැගෙනහිර මායිම ද, අංක 109 දරන අන්දරවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම සහ අංක 99 දරන රන්මුදුවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ප්‍රථමයෙන් සඳහන් කරන ලද ලුණුගම්වෙහෙර හා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද මායිම් වේ.

08-685/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.